# අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය සංචාරක මධ්‍යස්ථානයක් ලෙස වැඩි දියුණු කිරීමට ගත හැකි පියවර පිළිබඳ අධ්‍යයනයක්

*ජී.ඩබ්ලිව්.ටී.එස්. නවෝදි [1]*

ශ්‍රී ලංකාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඓතිහාසික රුවන්වැලිසෑය සමීපයෙහි අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය පිහිටා තිබේ. මෙය ලංකාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ පවතින විශාලතම මෙන් ම පැරණිතම කෞතුකාගාරය ලෙස සැලකේ. එමෙන් ම මේ වන විට විශාලතම ශිලාලේඛන භාරකාරීත්වය ද දරන්නේ මෙම කෞතුකාගාරයයි. මෙවැනි අතිශය වටිනාකමකින් යුත් අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය එහි ඓතිහාසික අගය සුරක්ෂිත කරමින් සංචාරක කර්මාන්තයට විවෘත කළ යුත්තේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුවයි. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ දැනට පවත්නා අඩුපාඩු සකස් කර ගනිමින් එය සංචාරක තෝතැන්නක් බවට පත් කිරීමට අවශ්‍ය යෝජනා සකසා ලීමයි. මෙම අධ්‍යයනය සඳහා සාහිත්‍ය මූලාශ්‍රය යටතේ ප්‍රාථමික මූලාශ්‍ය සහ ද්විතීයක මූලාශ්‍රය තුළින් දත්ත රැස් කරන ලදී. එමෙන් ම මෙම පුරාවිද්‍යා කෞතුකාගාරය සහ අවට ප්‍රදේශය තුළ ක්ෂේත්‍ර චාරිකාවේ යෙදෙමින් ද කරුණු රැස් කරන ලදී. මෙලෙස එක්රැස් කරගත් කරුණු විශ්ලේෂණය කිරීමේ දී සංසන්දනාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ අනුරාධපුරයෙහි පවතින අභයගිරි හා ජේතවන කෞතුකාගාරයන් සංචාරක මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය වුව ද අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය සංචාරකයන්ගේ අවධානය යම්කිසි අවම මට්ටමක පැවතීමට හේතු සොයා බලන ලදී. එමෙන් ම ලංකාවේ කොළඹ ඇතුළු අනෙකුත් කෞතුකාගාරයන් සමඟ ද දත්ත රැස් කොට සංසන්දනාත්මක ආකාරයෙන් කරුණු විශ්ලේෂණය කරන ලදී. මෙම පුරාවිද්‍යා කෞතුකාගාරය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී මෙහි ගැටලුකාරීත්වයක් ද දැකිය හැකි ය. මෙම ස්ථානයට ළඟා වීමට ඇති මාර්ගය පිළිබඳ ව ජනතා දැනුවත්භාවය අවම වීම, කෞතුකාගාරය තුළ කෞතුක වස්තූන් ඡායාරූප සහ වීඩියෝ ගැනීමට අවස්ථාව ලබා නොදීම යනාදිය ගැටලු ලෙස පෙන්වා දිය හැකි ය. එමෙන් ම ලෝකයේ ප්‍රකට ජනතා ආකර්ෂණය පවතින කෞතුකාගාරයන් සමඟ සසඳා බැලීමේ දී මෙම අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය තුළ සංචාරක කර්මාන්තය දියුණු කිරීමට යෝජනා මෙලෙස පෙන්වා දිය හැකි ය. ඩිජිටල් තාක්ෂණයන් භාවිත කිරීම, බහුභාෂා සංදර්ශක සහ භාෂා පරිවර්තන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, කෞතුකාගාර යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ නවීකරණය කිරීම, අතථ්‍ය චාරිකා වැඩිදියුණු කිරීම, කෞතුකාගාරය තුළ අධ්‍යාපනික සහ මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ මෙම කෞතුකාගාරය හුදෙක් තාක්ෂණය පදනම් කරගත් එකක් නිසා තාක්ෂණය භාවිත කරන ආකාරය පිළිබඳ ව අනුරුවවල් සකස් කිරීම යනාදීය යම්තාක් දුරකට හෝ අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය තුළ ස්ථාපිත කළ හැකි නම් මෙම ස්ථානය සංචාරක තෝතැන්නක් බවට පත් කළ හැකි ය. මෙලෙස සංවර්ධිත කෞතුකාගාරයක් දෙස් විදෙස් සංචාරකයන්ට විවෘත කිරීම තුළින් ලංකාව තුළ බිඳ වැටී ඇති ආර්ථිකය යළි නඟා සිටුවීමට ද එය දායක කරගත හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරය, තාක්ෂණය, රටේ ආර්ථිකය, සංචාරක කර්මාන්තය, සංචාරක තෝතැන්න,

[1] මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
gwtsnawodi.2000@gmail.com